EDCS

ආරම්භය: 1930 ලි.ප. අංකය: 736
ஆரம்பம்: 1930 பதிவு இல: 736
Inception: 1930 Reg. No: 736

# සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය

# තනතුරු පුරප්පාඩු

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියා කරනු ලබන සමුපකාර සමිතියකි.

සමිතියේ නුවරඑළිය සහ කතරගම නිවාඩු නිකේතනවල පවතින නිවාඩු නිකේතන කළමනාකරු තනතුරේ පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**මේ සඳහා කුසලතාපූර්ණ, උද්යෝගිමත් හා කැපවීමෙන් යුතුව වැඩකිරීමේ හැකියාව ඇති සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.**

## නිවාඩු නිකේතන කළමනාකරු - E.3.3. (විධායක ශ්‍රේණිය III වන පන්තිය)

**සුදුසුකම්**

නේවාසික කළමනාකරණය / හෝටල් කළමනාකරණය විෂය ඇතුළත් වන පරිදි පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

හෝ

රජය හෝ රජය විසින් පිළිගත් හෝටල් පාසලක නේවාසික කළමනාකරණය / හෝටල් කළමනාකරණය සම්බන්ධ ඩිප්ලෝමාවක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද

හෝ

අ.පො.ස. උ/පෙළ සමග නේවාසික කළමනාකරණ තනතුරේ වසර 10 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :** මාසික 28,700 - 425 X 10 - 450 X 10 - 37,450/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

**සැ.යු. :-**

1. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.
2. ජීව දත්ත සහිත සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද ඇතුළත්ව තමා විසින්ම සකස් කළ අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතු අතර, දැනටමත් ඔබ සමුපකාර සමිතියක සේවය කරයිනම්, අදාළ අයදුම්පත්‍රය එම සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම සමුපකාර සමිතියක සේවය කරමින් සිට අදාළ අයදුම්පත්‍රය එම සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් නොකර සිට බඳවා ගන්නා අවස්ථාවේදී ඒ බව තහවුරු වුවහොත් අදාළ තනතුර ලබා නොදීමට කටයුතු කරනු ලැබේ.
3. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත වන අතර, තෝරා ගනු ලබන අයගේ වැටුපෙන් 10% ක් ද ආයතනයෙන් 15% ක් ද සමග සේවක අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.
4. තෝරා ගන්නා අයදුම්කරුවන් විශ්‍රාම ශාලාව තුළ නේවාසිකව රාජකාරී කටයුතු සිදු කළ යුතු අතර, රාජකාරී සඳහා වාර්තා කරන ලෙස කරනු ලබන හදිසි දැනුම් දීමකදී සේවයට වාර්තා කිරීමට බැඳී සිටිය යුතුය.
5. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, පාලක මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
6. සමිතිය සතු ඕනෑම නිවාඩු නිකේතනයක / විශ්‍රාමශාලාවක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
7. තමාගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද දැක්වෙන සහතිකවල පිටපත් ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ද සමග අයදුම්පත්‍රය 2024-05-18 දින දහවල් 12.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

**ප්‍රධාන සභාපති**
**සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය**
**අංක 294, ගාලු පාර, කොළඹ 03.**
**දුරකථන අංකය : 011 2370717 ෆැක්ස් : 0112577475**